රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංකය :- 6

මගේ අංකය: 76/1/4/6 (එම්සීබී/1)
කොළඹ-7, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.
1973 මාර්තු මස 12 දා.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සහ අනිකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවැනි භාෂා පිළිබඳ පරීක්ෂණ - 1973 අප්‍රේල්.**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සහ අනිකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවැනි භාෂා පිළිබඳ පරීක්ෂණ, 1973 අප්‍රේල් 23 දින ආරම්භ කොට කොළඹ දී පවත්වනු ලැබේ. 1973 මාර්තු 22 වැනි දින දක්වා විභාග කොමසාරිස් විසින් මෙම පරීක්ෂණ සඳහා ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. මෙම පරීක්ෂණ පිළිබඳ නිවේදනය 1973 මාර්තු 9 වැනි දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළ වේ.

2. ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ සහ ඔබ අමාත්‍යාංශය යටතේ පවත්නා මණ්ඩල, සංස්ථා සහ වෙනත් එවැනි ආයතනවල සේවයේ යෙදී සිටින අදාල සියළුම නිලධාරීන් ගේ අවධානය යථෝක්ත ගැසට් නිවේදනය කෙරෙහි යොමු කරවනු මැනවි.

අ.ක./ ආර්.එම්.බී. සේනානායක.
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ.
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ.